00802

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

EPU3235- විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - පරිසර අධ්‍යයනය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2025.05.30 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගන්නා ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

## I - වන කොටස

01. ඔබේම වචන භාවිතා කරමින් "පරිසරය" යන පදය නිර්වචනය කරන්න.

02. පරිසරය සංරක්ෂණය සඳහා පාසලේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න.

03. ප්‍රධාන ගෝලීය පාරිසරික ගැටළු දෙකක් (02) ලැයිස්තුගත කර, ඒවාට මානව ක්‍රියාකාරකම් දායක වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ගෝලීය තිරසරභාවය සඳහා දායක වීමට පුද්ගලයන්ට ගත හැකි ක්‍රියාමාර්ග තුනක්(03) සඳහන් කර,එක් එක් ක්‍රියාව පරිසරය ආරක්ෂා කිරීමට උපකාරී වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයේ තක්සේරුකරණයේ ස්වභාවය පැහැදිලි කරන්න.

06. පෘථිවියේ විවිධ ප්‍රදේශ වලට ලැබෙන සූර්ය ශක්තියේ ප්‍රමාණයට අක්ෂාංශ බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.මෙම විචලනය සිදුවන්නේ ඇයි?

07. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ ඓතිහාසික වර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. "ගවේෂණය" යන පදය නිර්වචනය කරන්න. ප්‍රාථමික අධ්‍යාපනයේ සිසුන්ට පරිසර ගවේෂණය කිරීමේ වාසි තුනක් පැහැදිලි කරන්න.

(ලකුණු 05 X 08 =40)



47

## II - වන කොටස

09. I. පාසල් මුහුණ දෙන පොදු පාරිසරික ගැටළු හතරක් (04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05 )

II. ඓතිහාසික මහනුවර නගරය වර්තමානයේ අපද්‍රව්‍ය කළමනාකරණ ගැටළුවකට මුහුණ දී සිටින්නේ, දළදා මාලිගාවේ පූජනීය දන්ත ධාතූන් වහන්සේ ප්‍රදර්ශනය කිරීම සඳහා දහස් ගණනක් බැතිමතුන් එක්රැස් වීමත් සමඟය. පන්සල අවට වීදි පොලිතින් කවර, ප්ලාස්ටික් බෝතල් සහ ආහාර දවටන ඇතුළු කුණු කසළ වලින් පිරී ඇත. දිගු පෝලිම් වල රැඳී සිටි අමුත්තන් නිසි අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් නොමැතිකම පිළිබඳ ව කනස්සල්ල පළ කර ඇත. බොහෝ අය දිගු කාලයක් බලා සිටීම සඳහා සුලු කෑම, වතුර බෝතල් සහ වෙනත් ද්‍රව්‍ය ගෙන එන නමුත් පෝලිම් ඉදිරියට යත්ම තම කුණු කසළ අතහැර දැමීමට නැඹුරු වන බව නගර සභා නිලධාරියෙක් පැහැදිලි කළේය. (ඩේලිමිරර් 19/4/25)

(i) ඉහත තත්ත්වය ශ්‍රී ලංකාවේ පරිසරයට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05 )

(ii) ප්‍රාථමික ගුරුවරයෙකු ලෙස, අනාගතයේදී එවැනි පාරිසරික ගැටළු වළක්වා ගැනීම සඳහා ඔබේ සිසුන්ගේ ආකල්ප වර්ධනය කරන්නේ කෙසේද? (ලකුණු 10 )

10. "මූල් ළමාවිය අධ්‍යාපනය තුළ දරුවන්ගේ අවබෝධය සහ සංවර්ධනය හැඩගැස්වීමේදී පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි."

I. විෂයක් ලෙස පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයේ සමෝධානික ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 05 )

II. මෙම විෂය මඟින් සිසුන් තුළ සංවර්ධනය කිරීමට අරමුණු කරන ප්‍රධාන නිපුණතා හඳුනාගෙන ඒවා විස්තාරණය (elaborate) කරන්න. (ලකුණු 07 )

III. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ විෂයමාලාවේ සම විෂයයන් අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 08 )



49

11. "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්වල ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී සන්නිවේදනය අත්‍යවශ්‍ය අංගයක් වන අතර ප්‍රාථමික සිසුන් තුළ නිපුණතා සංවර්ධනය කිරීමේදී එය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි."

I. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගැන්වීමේ සංදර්භය තුළ සන්නිවේදනයේ මූලික කාර්යයන් සහ සීමාවන් අදාළ උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 05 )

II. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළින් සිසුන් තුළ වර්ධනය කිරීමට අපේක්ෂා කරන සන්නිවේදන කුසලතා අදාළ උදාහරණ සමඟ හඳුනාගෙන විස්තර කරන්න. (ලකුණු 07 )

III. ප්‍රාථමික සිසුන්ට සුදුසු ඵලදායී සන්නිවේදන උපායමාර්ග ප්‍රවර්ධනය කිරීමේදී ගුරුවරයාගේ කාර්යභාරය අදාළ උදාහරණ සමඟ සාකච්ඡා කරන්න. (ලකුණු 08 )

12. I. පළමුවන ශ්‍රේණියේ සිසුන් තුළ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය තුළින් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන ඉගෙනුම් ඵල හයක් (06) කෙටියෙන් සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 10 )

II. මුල් ළමාවියේ දරුවෙකු පරිසරය සහ එහි සංවර්ධනය හඳුනාගෙන එය අවබෝධ කර ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 10 )

13. I. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේදී අවිධිමත් තක්සේරු ක්‍රම භාවිත කළ හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 )

II. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරුකිරීමේදී සහ ඇගයීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන අංග මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 12 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*